(iv) වැටුප් සහ දීමනා;

(v) කාර්ය මණ්ඩල පහසුකම්;

(vi) වාහන ඇතුළු වෙනත් පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අප්‍රේල් මස 06 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2496/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙම වර්ෂයේ මුල් කන්නයේදී බස්නාහිර පළාතේ වගා කරන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) බස්නාහිර පළාතේ වගා නොකළ පුරන් වූ කුඹුරු බිම් ප්‍රමාණය කොපමණද;

(iii) වගා නොකර පුරන් වූ කුඹුරුවලින් රටට අහිමි වූ වී මෙට්‍රික් ටොන් ප්‍රමාණය කොපමණද;

(iv) වගාකළ එහෙත්, හානි වූ කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(v) සිදු වූ හානිය නැවත වරක් සිදුනොවීමට/අවම කිරීමට ගත් කාලීන ක්‍රියාමාර්ග කවරේද;

(vi) වගා හානි සිදුවීමෙන් අසරණ වූ ගොවීන්ට හානි පූර්ණය ලබා දෙන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වගා නොකරන කුඹුරු වෙනත් ආර්ථික කටයුත්තකට යෙදවීමට අවසර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කලේද;

(iii) එම ශක්‍යතා අධ්‍යයනයෙහි නිගමනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අප්‍රේල් මස 17 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2497/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ පළමු මාස 06 තුළ සීමාසහිත ලංකා සතොස මඟින් ආනයනය කරනු ලැබූ සීනි ප්‍රමාණය කොපමණද;

(ii) සීනි ආනයනය සඳහා සිදු කර ඇති මුළු වියදම කොපමණද;

(iii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එක් එක් ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සීනි කිලෝවක ආනයන මිල හා දේශීය වෙළඳපොළෙහි මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ සඳහා එම කාලය තුළ බඳවාගෙන ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) 2015 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා වතුකරයේ පාසල් සඳහා රජය විසින් වැයකළ මුදල හා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2459/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව නගර සීමාවේ පිහිටා ඇති නගර සභා ගොඩනැගිල්ලට පිටුපස ඇති ප්‍රදේශයේ පවුල් විශාල සංඛ්‍යාවක් ජීවත් වන බවත්;

(ii) ඔවුන් නිසි ප්‍රමිතියකින් තොර පැල්පත් සහ නිවාස ඉදිකර ඒවායේ පදිංචි වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නගර සංවර්ධනයෙහිලා වැදගත් වන නගර සීමාවේ පිහිටා ඇති මෙම කොටස නිසි පිළිවෙළකට සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2498/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තයේ නිරත වන සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, සමස්ථ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

(iii) කෘෂි සංවර්ධන කලාප ආරම්භ කර පවත්වාගෙන යාමට 2017 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(iv) ලෝක ආහාර අර්බුදයට පෙර සූදානමක් ලෙස ආරම්භ කරනු ලබන කෘෂි සංවර්ධන කලාපවලට අයත් වන නව ඉඩම් හෙක්ටයාර ප්‍රමාණය කොපමණද;

(v) 2016 වර්ෂය අවසන් වනවිට ආරම්භ කර ඇති කෘෂි සංවර්ධන කලාප කවරේද;

(vi) මෙතෙක් ආරම්භ නොකළ කෘෂි සංවර්ධන කලාප ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේ රජය සැලසුම් කළ පොකුරු ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(ii) 2017 මුල් භාගය වනවිට ආරම්භ කළ කෘෂි සායන සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි කෘෂි සායන ආරම්භ කරනු ලබන දිනය කවරේද;

1655/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි තිබේද;

(ii) එසේ නම්, එම තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි බදු දී තිබේද;

(iv) එසේ නම්, එම තෙල් ටැංකි බදු දී ඇති ආයතන හා රටවල් කවරේද;

(v) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු එම තෙල් ටැංකි බදු දීමෙන් සංස්ථාව ලබාගත් ආදායම, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2000/'17

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්යය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2008/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර හා නායයාම්වලින් අගතියට පත් පවුල්වලට ලබාදෙන බවට ප්‍රකාශ කරන ලද රක්ෂණ වන්දි මුදල එම පවුල්වලට ලැබී තිබේද;

(ii) 2016 වර්ෂයේ ගංවතුර ඇතිවූ අවස්ථාවේදී හානි වූ නිවසකට උපරිමය ලක්ෂ 25 දක්වා රක්ෂණ වන්දි මුදල් ලබාගත හැකි බව අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළද, එකී ගංවතුරට ලක් වූ කොළොන්නාව, අංගොඩ, වැල්ලම්පිටිය, සේදවත්ත, කැළණිමුල්ල, පැලියගොඩ, කඩුවෙල හා පහළ බෝමිරිය යන ප්‍රදේශයන්හි පිහිටි කිසිදු නිවසකට මේ දක්වා එබඳු රක්ෂණ වන්දි මුදලක් ලැබී නොමැති බව පිළිගන්නේද;

2191/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භූමිතෙල් මෙරටට ආනයනය කිරීමේදී භූමිතෙල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අයකරනු ලබන ආනයන බද්ද කොපමණද;

(ii) භූමිතෙල් සඳහා රජය විසින් ආනයන බද්ද හැර වෙනත් බදු අය කරන්නේද;

(iii) එසේ නම්, එම බදු වර්ග කවරේද;

(iv) එක් ලීටරයක් සඳහා අයකරනු ලබන බදු ප්‍රමාණය, එක් එක් බදු වර්ගය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) භූමිතෙල් ලීටරයක් සඳහා රජය විසින් අයකරනු ලබන මුළු බදු ප්‍රමාණය, භූමිතෙල් ලීටරයක සිල්ලර මිලෙහි කවර ප්‍රතිශතයක්ද;

(ii) භූමිතෙල් සඳහා රජය විසින් අයකරනු ලබන සියලු බදු ඉවත් කළහොත්, පාරිභෝගිකයාට භූමිතෙල් ලීටරයක් ලබා දිය හැකි සිල්ලර මිල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2200/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ පදිංචි ද්‍රවිඩ කම්කරුවන් පවුල් ලක්ෂ 08ක් පමණ මේ දක්වා අඩි 10x12 ලයින් කාමරවල ජීවත්වන බව පිළිගන්නේද;

(ii) ඔවුන්ට නිවාස ලබාදීම සඳහා පසුගිය රජය විසින් ආරම්භ කළ වැඩපිළිවෙළට අනුව 2014.12.31 දින වනවිට ඉදිකර තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් නිවාස ඉදිකර ඇති වතු සහ දිස්ත්‍රික්ක කවරේද;

(iv) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මෙම ව්‍යාපෘතියට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(v) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඉදිකළ නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) වතුකරයේ ජීවත්වන ජනතාවට පැවති රජයන් විසින් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(vii) මෙම නිවාස ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳීමට ගතවන කාලය කොපමණද;

(viii) එම වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2219/'17

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2012 සිට 2016 දක්වා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව;

(i) ලැබූ මුළු ආදායම;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ලැබූ ආදායම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

2346/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කය සඳහා වන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට එම තනතුරුවල සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පවතින පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

(iv) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවති (සීමිත/විවෘත) තරඟ විභාගවලින් සමත් වූ අයගේ නම්, ලිපිනයන් කවරේද;

(v) එම පිරිසට අදාළ පත්වීම් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2414/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගය ව්‍යාප්ත වෙමින් පවතින කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වකුගඩු රෝගීන්ට තම ඖෂධ සඳහා වැඩි මුදලක් වැය කිරීමට සිදු වී ඇති බැවින්, ඔවුන්ට නිවාස ඉදිකරදීමට හා ඔවුන් විසින් ඉදිකිරීම් ආරම්භ කර ඇති නිවාසවල වැඩ කටයුතු නිම කිරීමට අමාත්‍යාංශය විසින් යම් වැඩසටහනක් දියත්කර තිබේද;

(ii) එසේ නම්, එලෙස ආධාර ලැබූ පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කවරේද;

(iii) ඉදිරියේදී මෙම වැඩසටහන දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2438/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2013, 2014 හෝ ඊට ආසන්න වර්ෂයකදී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට ඉන්ධන පොම්ප (මනු කඩන) තොගයක් මිලදී ගත්තේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඉන්ධන පොම්පවල නිෂ්පාදිත රට, නිෂ්පාදිත වර්ෂය හා වර්ගය කවරේද;

(iv) එක් ඉන්ධන පොම්පයක මිල කොපමණද;

(v) ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉන්ධන පොම්ප වර්ගය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමිති පරීක්ෂණයෙන් අනුමත වූ ඒවාද;

(ii) එම පොම්ප මේ වනවිට භාවිතයේ පවතීද, භාවිතයෙන් ඉවත් කර තිබේද;

(iii) භාවිතයෙන් ඉවත්කර තිබේ නම්, එයට හේතුව කවරේද;

(iv) භාවිතයෙන් ඉවත් කර තිබේ නම්, එම පොම්ප මිලදී ගත් නිලධාරීන්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

(v) මෙම මිලදී ගැනීම හේතුවෙන් රජයට සිදුවූ මූල්‍ය පාඩුව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2465/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 492 - අමුණුවැටිය ග්‍රාම නිලධාරි වසමේ, කලාවැව කුඹුරුයාය මැදින් අලහප්පෙරුමාගම දක්වා දිවෙන කෘෂි මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) ගොවීන් 1000 ක් පමණ තමන්ගේ එදිනෙදා කටයුතු සිදු කිරීමට මෙම මාර්ගය යොදා ගන්නා අතර අස්වනු නෙලන සමයේ දී ඔවුන් තම අස්වැන්න මෙම කෘෂි මාර්ගය ඔස්සේ ප්‍රවාහනය කිරීමේදී බොහෝ දුෂ්කරතාවන්ට ලක්වන බවත්;

(iii) මෙම මාර්ගය අවුරුදු 30 කින් පමණ ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) මේ සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2500/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂය තුළ මෙරටට ආනයනය කරන ලද ග්ලයිපොසේට් ලීටර් ප්‍රමාණය කොපමණද;

(ii) එම ආනයන සිදු කළ ආයතන කවරේද;

(iii) ආනයන අපනයන පනතට අනුව ග්ලයිපොසේට් ආනයනය කිරීමේ සීමා කවරේද;

(iv) ඉහත සීමාවන් ප්‍රායෝගිකව පවත්වාගෙන යාමට ගත් පියවර කවරේද;

(v) දැනට රඳවාගෙන ඇති ග්ලයිපොසේට් ප්‍රමාණය කොපමණද;

(vi) එම ග්ලයිපොසේට් විනාශ කර දැමීමේ ක්‍රමවේදයන් කවරේද;

(vii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?